පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

අභියාචනා අංක:- AAT/108/2025 (NPC)

ඩබ්.ඒ.එස්. වික්‍රමසිංහ
අභියාචක
එදිරිව,
ජාතික පොලිස් කොමිෂන් සභාව
වගඋත්තරකරු

දිනය : 2026.03.04

ඉදිරියේ දී **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඒ.එම්.වන්සේකර මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

-<u>නියෝගය</u>-

මෙම අභියාචනය කරුණු විමසීමට ගැනීමෙන් අනතුරුව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින ආර්.එම්.එස්.පී.රත්නායක මහතා පසුගිය දින දන්වා සිටියේ මෙම අභියාචකව නැවත සේවයේ පිහිටුවීමට පොලිස්පතිතුමා විසින් නිර්දේශයක් කර ඇති බවයි. ඒ අනුව අද දින ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2026.03.03 දිනැති වාර්තාව ඉදිරිපත් කර ඇත. එම වාර්තාවෙහි (IX) ඡේදයෙහි සඳහන් කර ඇත්තේ, එහි සඳහන් කොන්දේසිවලට යටත්ව අභියාචක නැවත සේවයේ පිහිටුවීමට පොලිස්පති නිර්දේශ කරන බවයි. ඒ අනුව එම නිර්දේශය සළකා බලා, ඉහත කී 2026.03.03 දිනැති වාර්තාවේ සඳහන් කොන්දේසිවලට යටත්ව මෙම අභියාචක

නැවත සේවයේ පිහිටු වීමට නියෝග කරමු. මෙම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවට තවදුරටත් දන්වා සිටිමු.

ඉහත කොන්දේසිවලට යටත්ව අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/